**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 397**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ එකොළොස්වැනි වාර්තාව

(2025.10.10 වැනි දින ලංකා සතොස ලිමිටඩ් සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර
මහතා විසින්
2025 දෙසැම්බර් මස 18 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

**<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>**

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., *(2025.03.21 දින සිට.)*
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
8. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., *( 2025.05.08 දින සිට)*
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., *(2025.03.21 දින සිට)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යාලිංගම් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,

29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*

## <u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) -හිමාලි සමරදිවාකර මෙය
- ❖ ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

**පටුන**

| | | |
|---|---|---|
| | | පිටු අංක |
| 1. | සභාපතිතුමාගේ සටහන | V |
| 2. | විධායක සාරාංශය | VI |
| 3. | දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ එකොළොස්වැනි වාර්තාව | VII |
| 4. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 1 |
| 5. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතනය- ලංකා සතොස ලිමිටඩ් | 2 -19 |

## සභාපතිතුමාගේ සටහන

පාර්ලිමේන්තුවේ විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා යටතේ ස්ථාපිත, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2025.10.10 දින පරීක්ෂාවට ලක් කළ වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ලංකා සතොස ලිමිටඩ් හි 2021 හා 2022 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්යසාධනයට අදාළව සිදු කළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

ලංකා සතොස ලිමිටඩ් සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2005 ඔක්තෝබර් 26 දින සංස්ථාපනය කර පසුව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2010 මාර්තු 19 දින නැවත ලියාපදිංචි කරන ලද පූර්ණ අයිතිය රජය සතු සමාගමකි.

ලංකා සතොස ලිමිටඩ් ආයතනයේ දැක්ම වන "ශ්‍රී ලංකාවේ සැබෑ ජීවන වියදම පිළිබිඹු කරන, රට තුළ මිල නියම කරන්නා බවට පත්වීම" වන නමුත් තොග වෙළඳාම වෙනත් ආයතනයක් සතුව පවතින විට මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම අසීරු බව කාරක සභාවේ අදහස වූ අතර ලංකා සතොස සතුව පවතින වෙළඳපොළ කොටස වර්ධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය වූ 4246 අතුරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 18 ක්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 353 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 856 ක් පැවතීම හා සමාගම ආරම්භයේ සිටම ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවා ගැනීම තුළ ආයතනයේ වගවීම හා වගකීම සම්බන්ධ ගැටලු පැනනගින බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පරීක්ෂණ මගින් අනාවරණය කර ගන්නා වැදගත් කරුණු පිළිබඳව අවධානය යොමු කර ලබා දෙන නිර්දේශ වලින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා එකී නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා ඒ පිළිබඳව අඛණ්ඩ පසුවිපරම් කිරීම ඉතා වැදගත් වේ. කාරක සභාවේ සභාපති වශයෙන් කටයුතු කරමින් රාජ්‍ය ව්‍යවසායන් රටේ අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, එම කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් සහ උපදේශකවරු දෙදෙනාගෙන් ලැබෙන සහායත්, විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් සහ භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් ලැබෙන සහායත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

<u>**විධායක සාරාංශය**</u>

2025.10.10 වැනි දින පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලංකා සතොස ලිමිටඩ් හි 2021, 2022 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා හා එහි වත්මන් කාර්යසාධනය පිළිබඳව කරුණු පරීක්ෂා කරන ලදී.

ලංකා සතොස ලිමිටඩ් හි දැක්ම හා අරමුණු, අවදානම් කමිටු, උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අභ්‍යන්තර විගණනය, කාර්ය මණ්ඩල සංයුතිය, යනාදී ඉතා වැදගත් ආයතනික කරුණු සම්බන්ධයෙන් මෙහි සඳහන් කර ඇත. ලංකා සතොස ලිමිටඩ් හි වෙළඳපොල කොටස වැඩි කර ගැනීම, කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු සඳහා නිලධාරීන් ස්ථිර පදනමින් බඳවා ගැනීමේ වැදගත්කම ද අවධාරණය කර ඇත.

ලංකා සතොස ආයතනය විසින් 2014 සහ 2015 වර්ෂවලදී ආනයනය කරන ලද සහල් සඳහා රු.27,011,980,142ක පිරිවැයක් දැරීමට සිදු වුවද එම සහල් තොගය අලෙවියෙන් රු. 11,854,949,124ක ආදායමක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව දේශීය සහල් වෙළඳපල තත්ත්වය, වී අස්වැන්න ලැබීම සහ සහල් ගබඩා කිරීමේ පහසුකම් පිළිබඳ නිසි අධ්‍යයනයක් නොකර විධිමත් ප්‍රසම්පාදන පටිපාටිවලට පටහැනිව සහල් ආනයනය කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් රු.15,157,031,018ක අලාභයක් සමාගමට සිදු වී තිබූ අතර මේ පිළිබඳ වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට ආයතනික මට්ටමින් පරීක්ෂණයක් සිදු කර නොතිබීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය.

නිසි අනුමැතියකින් තොරව දිරිදීමනා, කාර්යසාධන දීමනා හා ප්‍රවාහන දීමනා ගෙවීම, ගොඩනැගිලි නොමැති හිස් ඉඩම් සඳහා අනාගතයේ වෙළඳසැල් ආරම්භ කිරීමේ උපකල්පනය මත අත්තිකාරම් ගෙවා තිබීම යනාදී කරුණු සලකා බලා ඉන් අනතුරුව ලබාදුන් නිර්දේශ මෙහි අන්තර්ගත වන අතර රු. මි. 200 ක පමණ වියදමක් දරා කිළිනොච්චිය නගරයේ ඉදිකරන ලද ගොඩනැගිල්ල, මාසිකව රු. 200,000 ක මුදලකට වෙනත් ආයතනයකට කුලී පදනම මත ලබා දීම සම්බන්ධයෙන් හා ආයතනය සතු ව්‍යවසාය සම්පත් සංවර්ධන පද්ධතිය සම්බන්ධයෙන් වන නිර්දේශ ද මෙහි අඩංගු කර ඇත.

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ එකළොස්වැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ එකොළොස්වැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ (පළමු මාස 11 තුළදී) දී පහත සඳහන් පරිදි කාරක සභා රැස්වීම් පවත්වා ඇත.

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.18 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.20 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2025.03.12 |
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.27 |

| | | |
|---|---|---|
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගම | 2025.04.02 |
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගම | 2025.05.09 |
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2025.05.15 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.05.23 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2025.06.20 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 2025.07.09 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.07.17 |
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 2025.07.23 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 |
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2025.09.10 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2025.09.12 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 2025.09.24 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 2025.10.08 |
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 |
| 23. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 2025.10.24 |
| 24. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 |
| 25. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.26 |

ඒ අතරින්, 2025.10.10 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ලංකා සතොස ලිමිටඩ් හි 2021හා 2022 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

## <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

ලංකා සතොස ලිමිටඩ් විසින් 2021 හා 2022 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| ආයතනය | වර්ෂය | |
|---|---|---|
| | **2021** | **2022** |
| ලංකා සතොස ලිමිටඩ් | ව්‍යාවචනය කළ මතය | ව්‍යාවචනය කළ මතය |

<u>විගණන මත වර්ග</u>

**01.** <u>තත්ත්වාගණනය නොකළ මතය</u> **(Unqualified Opinion)**

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02.** <u>තත්ත්වාගණනය කළ මතය</u> **(Qualified Opinion)**

වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03.** <u>මතය ව්‍යාවචනය කිරීම</u> **(Disclaimer of Opinion)**

ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04.** <u>අහිතකර මතය (Adverse Opinion)</u>

ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

**ලංකා සතොස ලිමිටඩ්**

***(වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය)***

**විමර්ශනය කළ දිනය -2025.10.10**

**සාකච්ඡා කළ කරුණු**

## 01. ආයතනය සම්බන්ධ පොදු කරුණු

### 1.1 ලංකා සතොස ලිමිටඩ් පිහිටුවීම

ලංකා සතොස ලිමිටඩ් සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2005 ඔක්තෝබර් 26 දින සංස්ථාපනය කර පසුව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2010 මාර්තු 19 දින නැවත ලියාපදිංචි කරන ලද පූර්ණ අයිතිය රජය සතු සමාගමක් වන අතර එහි කොටස් හිමිකමේ සංයුතිය පහත පරිදි වේ.

| කොටස් හිමිකම | කොටස් ප්‍රමාණය | වටිනාකම (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| භාණ්ඩාගාරලේකම් | 87,095,381 | 870,953,810 | 97.45 |
| සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) | 2,279,884 | 22,798,840 | 2.55 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 7 | 70 | 1 ට අඩු |
| **එකතුව** | **89,375,272** | **893,752,720** | **100.00** |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව (Cooperative Wholesale Establishment) යනු අත්‍යාවශ්‍ය භාණ්ඩ සැපයීමේ නිරත පැරණිතම ආයතනයයි. නව රජයේ ප්‍රතිපත්තිය අනුව මෙම සංස්ථාව, භාණ්ඩ ආනයනය, සැපයුම් හා තොග වෙළඳාම් කටයුතු සඳහා පමණක් භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලබයි. 2005 වර්ෂයේදී

ස්ථාපිත කරන ලද ලංකා සතොස ආයතනය සුපිරි වෙළඳසැල් ක්‍රමයක් ලෙස ආරම්භ කර ඇත.

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය, ලංකා සතොස සමාගමේ කටයුතුවලට බාධාකාරී නොවන අයුරින් ක්‍රියාත්මක වීම වඩා ඵලදායක වේ.

## 1.2 <u>ලංකා සතොස ලිමිටඩ් හි දැක්ම හා අරමුණු</u>

ලංකා සතොස ලිමිටඩ් ආයතනයේ දැක්ම "ශ්‍රී ලංකාවේ සැබෑ ජීවන වියදම පිළිබිඹු කරන, රට තුළ මිල නියම කරන්නා බවට පත්වීම" යි. නමුත් තොග වෙළඳාම වෙනත් ආයතනයක් සතුව පවතින අවස්ථාවන්හිදී මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම ඉතා අසීරු කටයුත්තක් ව පවතී.

භාණ්ඩවල මිල ගණන් මෙහෙයවීම වැඩි වශයෙන් වෙළඳපොල යාන්ත්‍රණය (market forces) විසින් සිදු කරනු ලැබුව ද ලංකා සතොස සමාගම ආර්ථිකයේ මිල පාලන කටයුතු සඳහා මැදිහත්වීමක් කරනු ලැබේ. ඒ සඳහා සමාගම අරමුණු 4ක් යටතේ ක්‍රියාත්මක වනු ලැබේ. ඒවා නම්,

1. අඩු මිලට ගුණත්වයෙන් යුතු භාණ්ඩ පාරිභෝගිකයා වෙත ලබා දීම
2. ගොවි ජනතාව සෘජුව වෙළඳපොල සමග සම්බන්ධකර ගැනීම තුළින් ඔවුන් සවිබල ගැන්වීම
3. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සෘජුව වෙළඳපොල සමග සම්බන්ධ කර ඔවුන් දිරිගැන්වීම
4. ආයතනයේ සේවකයන්ට තම රාජකාරි අවංකව හා කාර්යක්ෂමව ඉටුකළ හැකි යහපත් පරිසරයක් නිර්මාණය කරදීම.

වර්තමානයේදී ලංකා සතොස, තම ආයතනය සතුව පවතින වෙළඳපොළ කොටස වර්ධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතුවල නිරතව සිටී.

පසුගිය වකවානුවේදී ලංකා සතොස ආයතනය මූල්‍යමය අර්බුදයක පැවති අතර, රු.බි. 23ක පමණ අලාභයක් ලබා ඇත. එමෙන්ම රු.බි. 11ක පමණ මුදලක් සැපයුම්කරුවන්ට ගෙවීමට ඇති අතර රු.බි. 5.3 ක බැංකු අයිරාවක් ද පවතී.

ඒ අනුව මෙම සමාගම මූල්‍යමය වශයෙන් බංකොලොත් සමාගමක් ලෙස සලකනු ලබන බැවින්, විගණන මතය පවා ව්‍යාචනය කර ඇත. ඒ සඳහා මූලිකවම හේතුවී ඇත්තේ තොග පාලනයේ පැවති දුර්වලතා වේ. තොග විචලනය සම්බන්ධව පරීක්ෂා කිරීමට වෝහාරික විගණනයක් සිදු කිරීමට සමාගම අපේක්ෂා කරයි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් දක්වා ඇති අරමුණු, පරමාර්ථ හා ආයතනයේ නව අරමුණු අතර වෙනස්කම් පවතින බැවින් පාරිභෝගික අවශ්‍යතා සාක්ෂාත් වන පරිදි මෙම ආයතනයේ අරමුණු හා පරමාර්ථ සාංගමික ව්‍යවස්ථාවලිය තුළ යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයක් ද ඇත.

<u>නිර්දේශ</u>

i. සමාගමේ දැක්ම හා අරමුණු සමාලෝචනය කිරීම.
ii. සමාගමේ අරමුණු හා පරමාර්ථ වර්තමානයට ගැලපෙන පරිදි වෙනස් කරගැනීම.

## 1.3 <u>අවදානම් කමිටු</u>

අවදානම් කමිටුවේ කාර්යභාරය වන්නේ ව්‍යාපාර අවදානම් හඳුනාගැනීම හා ඒවා නිසි පරිදි කළමනාකරණය කරමින් අවදානම් අවම කිරීමට අවශ්‍ය කටයුතු කිරීමයි. 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාවසායන්ගේ සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශයේ 4.3 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට එක්වරක්, අධ්‍යක්ෂ මණ්ඩලයේ 03 දෙනෙකුගෙන් යුත්, උප කමිටුවක් ලෙස අවදානම් කමිටු රැස්විය යුතු වුවත් 2023 අප්‍රේල් 04 දිනෙන් පසුව 2025 සැප්තැම්බර් 25 දින දක්වා අවදානම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. 2024 වර්ෂයේ පවත්වා තිබූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අංක 148

හා 149 දී අවදානම් කමිටුවක් අලුතින් ස්ථාපිතකර තිබුණද, සභාපතිවරයෙකු පත්නොකිරීම හේතුවෙන් ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.

අවදානම් කමිටුවේ කාර්යභාරය නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාර අවදානම් (Business risks) පිළිබඳ දැනුමැති පාර්ශවයන් විසින් අවදානම් කමිටුව නියෝජනය කිරීම වැදගත් වේ.

<u>**නිර්දේශය**</u>

i. අවදානම් පිළිබඳව අධ්‍යයනයක් සහිත කණ්ඩායමක් හා එකී අවදානම් පිළිබඳව නිශ්චිත තොරතුරු ලබාගත හැකි නිලධාරියෙක් අවදානම් කමිටුවට පත්කිරීම.

## 1.4 <u>උපායමාර්ගික සැලැස්ම</u>

2024-2028 වර්ෂ සඳහා සකස් කර තිබූ උපායමාර්ගික සැලැස්ම 2025 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබිණි.

උපායමාර්ගික සැලැස්ම 2024- 2028 වර්ෂ දක්වා සකස් කර ඇති අතර එහි ධනාත්මක හා සෘණාත්මක උපනතීන් වාර්ෂිකව සමාලෝචනය කර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ.

නව රජයේ මාර්ගෝපදේශ අනුව පස් අවුරුදු සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය පවතී.

<u>**නිර්දේශ**</u>

i. නව රජයේ ප්‍රතිපත්ති සමග ගැලපෙන පරිදි සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම.
ii. සංයුක්ත සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන වන (Rolling model) පරිදි සකස් කිරීම.

## 1.5 ක්‍රියාකාරී සැලැස්ම

සමාගම විසින් 2022 සහ 2023 වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබිණි. 2024 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන තිබුණි. 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබූ නමුත් 2025 ජනවාරි සිට මාර්තු දක්වා පමණක් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා 2025 ජනවාරි 16 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව, 2025 පෙබරවාරි 13 දින රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකර තිබුණි.

සමාගම සම්බන්ධයෙන් දත්ත ප්‍රමාණවත් පරිදි නොමැතිවීම හේතුවෙන් වර්ෂයක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අපහසු බැවින් මාස 3 ක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීමෙන් අනතුරුව සමාගමේ සභාපතිවරයා විසින් අමාත්‍යාංශය වෙත කරන ලද ඉල්ලීමට අනුමැතිය ලබා දී තිබුණි.

**නිර්දේශය**

i. ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ඉදිරිපත් කිරීම.

## 1.6 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබූ අතර 2023 වර්ෂයට අදාළව විගණන මතය ද විගණකාධිපති විසින් තීරණය කර තිබුණි. 2024 වර්ෂයේ වාර්ෂික වාර්තාවද කෙටුම්පත් කර තිබුණි.

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගණනය කිරීම් සම්බන්ධයෙන් බොහෝ ගැටලු පවතින බැවින් ඒ සම්බන්ධයෙන් වැඩිදුර විශ්ලේෂණයක් සඳහා වෝහාරික විගණනයක් සිදු කිරීම යෝග්‍ය බව හඳුනාගෙන තිබුණි.

<u>නිර්දේශය</u>

i. ගිණුම් පරීක්ෂා කිරිම සඳහා ජාතික විගණන කාර්යාලය වෙත යොමු කර ඇති 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව කඩිනමින් සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## 1.7 <u>අභ්‍යන්තර විගණනය</u>

කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙහි වැඩ බැලීම සඳහා ද පත්කර තිබීම තුළින් ලබැදියාවන් අතර ගැටුමක් ඇති වී තිබුණි.

නමුත් ඔහු ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙහි වැඩ බැලීම සඳහා පත්කරන අවස්ථාවේ දී එම නිලධාරියා වෙත පවරා තිබූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක) තනතුරේ රාජකාරිවලින් ඔහුව නිදහස් කර තිබුණි.

## 1.8 <u>කාර්ය මණ්ඩල සංයුතිය</u>

2025 ජූනි 30 දිනට සමාගමේ කාර්ය මණ්ඩලය තුළ ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 18 ක් හා අතිරික්ත 02ක්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 353ක් හා අතිරික්ත 25ක්, ඇතුළත්ව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 856ක් හා අතිරික්ත සංඛ්‍යාව 226ක් විය. සමාගම ආරම්භයේ සිටම සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 8 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණ ද එම තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටීන් අනුමත කරගෙන නොතිබිණි. එම තනතුරු අතරින් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) යන තනතුරු 2025 අගෝස්තු 31 දින වන විටත් පුරප්පාඩුව පැවතිණි.

මෙම ආයතනයේ ප්‍රධානම ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු කොන්ත්‍රාත් පදනමින් පැවතීම හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු දරන නිලධාරීන් නිතර වෙනස්වීම තුළ ආයතනයේ වගවීම හා වගකීම සම්බන්ධ ගැටලු නිර්මාණය වීමේ ඉඩකඩ ඇත.

මෙම කාර්ය මණ්ඩලය 2017 දී අනුමත කරන ලද බවත් (cadre) තනතුරු 23ක් සඳහා පුරප්පාඩු පිරවීමට අවසන් වරට රැස්වූ අග්‍රාමාත්‍ය කමිටුවෙන් අනුමැතිය ලබා දී ඇති බවත්, බඳවා ගැනීම් පටිපාටි සම්බන්ධයෙන් අඩුපාඩු සහිතව ඉදිරිපත් වූ ඉල්ලීම්, අඩුපාඩු සම්පූර්ණ කර නැවත අනුමැතිය සඳහා යොමු කරන ලෙස දන්වමින් ආයතනය වෙත යොමු කර ඇති බවත්, ඉහළම තනතුරු කොන්ත්‍රාත් පදනම මත පැවතීම විශේෂ තත්ත්වයක් බවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ප්‍රකාශ කළාය.

ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට අවසර ලබාදීමේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කළ යුතුව තිබූ බවත් ආයතනය පරිහානියට ලක්වීමට ප්‍රධානම හේතුව වී ඇත්තේ වගකීම හා වගවීම ස්ථාපිතවී නොතිබීම බවත් නිරීක්ෂණය විය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණයට අනුව පෙර පැවති වසර 2 ක කොන්ත්‍රාත් කාල සීමාව වසර 5ක් දක්වා දීර්ඝ කොට ඇති බවත් ආයතනයේ ඉහළ තනතුරුවලට ලැබෙන වැටුප පුද්ගලික අංශයේ වැටුප්වලට සාපේක්ෂව පහළ අගයක් ගන්නා බැවින් නිලධාරීන් ආකර්ශණය කර ගැනීම හා රඳවා තබා ගැනීම දුෂ්කර බවත් අනාවරණය විය.

<u>නිර්දේශ</u>

i. සමාගමේ ප්‍රධානම වගකිවයුතු තනතුරු වන විධායක මට්ටමේ තනතුරු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම හා වැඩබැලීමේ පදනම මත පවත්වා

ගැනීම යන කරුණු සම්බන්ධව පූර්ණ අවධානය යොමු කර සාකච්ඡා කිරීම.

ii. කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් වන ඉල්ලීම් පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නැවත සලකා බැලීමට කටයුතු කිරීම.

iii. නිශ්චිත අනුමත කිරීම්වලින් පසුව බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම.

iv. ආයතනයේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් සකස් කිරීම.

v. ආයතනයේ ආකෘතියට ගැලපෙන සේවක මණ්ඩලයක් පවත්වාගෙන යාම.

## 1.9 අලෙවිසැල් හා තොග කළමනාකරණය

2025.09.25 දිනට සමාගමේ ප්‍රාදේශීය කාර්යාල 27ක් යටතේ අලෙවිසැල් 450 ක් ක්‍රියාත්මකව පවතින අතර 2023.12.31 දිනට ක්‍රියාත්මකව පැවති අලෙවිසැල් සංඛ්‍යාව 460 ක් වූ අතර ඉන් අලෙවිසැල් 91 ක් අලාභ ලබා තිබුණි. සමාගම ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීම අලෙවි කළමනාකරණය (Marketing Management) සතු වගකීමක් විය.

## 1.10 බැංකු අයිරා පොලිය

බැංකුවලින් ලබා ගෙන තිබූ බැංකු අයිරා සඳහා වන පොළී අනුපාත 12% සිට 9.5% ක් දක්වා අඩු කර ගැනීමමින් සඳහා කටයුතු කර තිබුණි.

## 02. <u>2023 ජූනි 22 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u>

### 2.1 <u>2014 හා 2015 වර්ෂවල සිදුකළ සහල් ආනයනය</u>

ලංකා සතොස ආයතනය විසින් 2014 සහ 2015 වර්ෂවලදී සිදු කර තිබුණු ආනයනික සහල් සඳහා රු.27,011,980,142ක පිරිවැයක් දැරීමට සිදු වුවද එම සහල් තොගය අලෙවියෙන් රු. 11,854,949,124ක ආදායමක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව දේශීය සහල් වෙළඳපල තත්ත්වය, වී අස්වැන්න ලැබීම සහ සහල් ගබඩා කිරීමේ පහසුකම් පිළිබඳ නිසි අධ්‍යයනයක් නොකර විධිමත් ප්‍රසම්පාදන විධිවිධානවලට පටහැනිව සහල් ආනයනය කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් රු.15,157,031,018ක අලාභයක් සමාගමට සිදු වී තිබුණි. මේ පිළිබඳව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට ආයතනික මට්ටමින් පරීක්ෂණයක් සිදුකර නොතිබීම සම්බන්ධව කාරක සභාව අප්‍රසාදය පළ කළ අතර, මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට ආයතනය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කර ඇති බව අනාවරණය විය.

<u>නිර්දේශ</u>

i. මෙලෙස ආයතනයට විශාල අලාභයක් සිදුවීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කිරීම.

ii. මේ සම්බන්ධයෙන් වන නීතිමය ක්‍රියාවලිය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

## 03. <u>2021 හා 2022 වර්ෂවල විගණන වාර්තාවලින් අනාවරණය වන කරුණු හා වර්තමාන තත්ත්වය</u>

### 3.1 <u>දිරි දීමනා</u>

2021 නොවැම්බර් 16 දිනැති අංක පී.ඊ.ඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් ක්‍රියාකාරී අත්පොතේ 3.2 ඡේදය ප්‍රකාරව දිරි දීමනා ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාගමේ සේවකයින්ට 2021 වර්ෂයේදී රු. 40,430,262 ක් ද, 2023 වර්ෂයේදී රු.37,669,517 ක් ද, දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

2025 ජූලි මස 21 දින වන විටත් චක්‍රලේඛ ප්‍රකාරව දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර 2024 වර්ෂය සඳහා ද දිරි දීමනා ලෙස රු. 29, 653, 900 ක මුදලක් ගෙවා තිබුණි.

<u>නිර්දේශය</u>

i. ඉහත චක්‍රලේඛය ප්‍රකාරව දිරි දීමනා ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබා ගැනීම.

### 3.2 <u>සමාගම විසින් ගොඩනැගිලි කුලියට ගැනීම</u>

ගොඩනැගිලි නොමැති හිස් ඉඩම් සඳහා අනාගතයේ වෙළඳසැල් ආරම්භ කිරීමේ උපකල්පනය මත අත්තිකාරම් නොගෙවිය යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දින වන විට එළඹ තිබූ ගිවිසුම් 29ක් අනුව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අත්තිකාරම් ලෙස රු. 34, 234, 996 ක මුදලක්, ඇස්තමේන්තුවක් ලබා ගැනීමකින් තොරව ගෙවා තිබූ අතර එසේ ඉදිකරන ලද ගොඩනැගිලිවලින් භාවිතයට සුදුසු පරිදි ඉදිකිරීම් සිදු කර

සමාගමට භාර දී නොතිබුණු ගොඩනැගිලි හිමිකරුවන් 29 දෙනෙකුගෙන් 18 දෙනෙකුට එරෙහිව මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණි.

මේ වන විටත් අයකර ගත නොහැකි වසර 5කට වඩා වැඩි කාලයක් ඉකුත් වූ රු. මි 36ක පමණ ප්‍රමාණයක් ඇත. මෙම මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති අතර දැනට අත්තිකාරම් ලබා දීම නතර කොට ඇත.

## 3.3 <u>කිළිනොච්චිය නගරයේ පිහිටි සමාගම සතු වර්ග අඩි 15000 ක ගොඩනැගිල්ල බදු පදනමට ලබාදීම</u>

රු. මි. 200 ක පමණ වියදමක් දරා කිළිනොච්චිය නගරයේ ඉදිකරන ලද සමාගම සතු වර්ග අඩි 15000 ක් පමණ විශාල ගොඩනැගිල්ලක්, මාසිකව රු. 200,000/- ක පමණ මුදලකට වසර 10 ක් සඳහා A9 Complex (pvt) Ltd සමාගමට බදු පදනම මත ලබා දී ඊට වඩා බොහෝ සෙයින් අඩු ඉඩකඩක් සහිත ගොඩනැගිල්ලක් සමාගම විසින් මාසිකව රු. 200,000/- ක මුදලකට කුලී පදනම මත ලබාගෙන ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබයි.

මෙය අමාත්‍යාංශ මට්ටමින් සිදුවූ ගිවිසුම්ගතවීමක් වන අතර ගොඩනැගිලි කමිටුවට එය ඉදිරිපත් වන විට සියල්ල සැලසුම් කර අවසන් ව තිබුණි.

මේ වන විට එම ගොඩනැගිල්ල නැවත ලංකා සතොස ආයතනයට ලබාදෙන මෙන් ලිඛිතව දන්වා ඇත.

ආයතනික දූෂණ අක්‍රමිකතා වැළැක්වීම සඳහා අභ්‍යන්තර විගණනයට විශාල වගකීමක් හා කාර්යභාරයක් ඇති බව කාරක සභාව අවධාරණය කළාය.

<u>**නිර්දේශ**</u>

i. මෙම ගොඩනැගිල්ල සමාගම වෙත ආපසු ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම.

ii. අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම හා විමර්ශන කටයුතු කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.

## 3.4 නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර, Head of online Trading ලෙස වෙනස් කර තිබීම

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර සඳහා බඳවා ගත් නිලධාරියාගේ තනතුරු නාමය Head of online Trading ලෙස වෙනස්කර තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර අදාළ තනතුර සඳහා 2021 නොවැම්බර් 01 දින බඳවාගත් නිලධාරියාට 2023 මැයි 31 දක්වා වැටුප් ලෙස රු. 4, 125, 000 ක මුදලක් ද ගෙවා තිබුණි.

අලෙවි අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කර තිබූ එම නිලධාරියා, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව කොන්ත්‍රාත් පදනම මත Head of online Trading තනතුරට බඳවා ගෙන, අවස්ථා කිහිපයකදී මාස 6 කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගෙන තිබූ අතර, 2025 අප්‍රේල් මස ඔහු එම තනතුරෙන් ඉවත්ව ගොස් තිබුණි.

## 3.5 රටබීම අලෙවිසැල් බලපත්‍ර ලබාගැනීම සඳහා උපදේශකවරයෙකු පත්කිරීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද තනතුරක් වූ රටබීම අලෙවිසැල් බලපත්‍ර ලබාගැනීම සඳහා වන උපදේශකවරයෙකු, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් පමණක් බඳවාගෙන තිබුණි.

මත්පැන් බලපත්‍ර ලබාගැනීමේ දී දීර්ඝ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ඇති බැවින් හා ලංකා සතොස ආයතනය මත්පැන් අලෙවිසැල් අලුතින්ම ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු සඳහා එක් කරගත් බැවින් එම කාර්යය පහසුකර ගැනීමේ දී විශේෂඥ සහාය අවශ්‍ය වූ බැවින් මෙලෙස උපදේශකයෙකු බඳවා ගැනීම සිදුකර තිබුණි.

<u>නිර්දේශ</u>

i. මෙම සමාගමේ බඳවාගැනීම් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කිරීම

ii. කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සම්බන්ධයෙන් ඉදිරියේදී සිදුකරන සියලු පත්කිරීම් වලට අදාළව පිටපතක් විගණකාධිපතිවරයා වෙත යොමු කිරීම.

## 3.6 <u>සීනි බදු ප්‍රතිශතය අඩුකිරීම හේතුවෙන් සමාගමට දැරීමට සිදු වූ අලාභය</u>

අංක 2197/12 හා 2020 ඔක්තෝබර් 13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2020 ඔක්තෝබර් 14 දින සිට සීනි 1kg ක් මත පනවා තිබූ බද්ද රු. 50 සිට ශත 25 දක්වා අඩුකිරීම නිසාවෙන් සමාගමට දැරීමට සිදුවූ සම්පූර්ණ අලාභය රු. 102,113,974 ක් වූ අතර ඉන් රු.37,159,974 ක් මහා භාණ්ඩාගාරය විසින් පියවා තිබූ බැවින් අය වී නොමැති අලාභය රු.64,954,000 ක් ව පැවතුනි.

රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස මෙලෙස සීනි සඳහා බදු මුදල් අඩුකිරීම සිදු කළ ද, ලංකා සතොස ආයතනය විසින් සීනි 1kg ක් රු. 85 ක මිලට අලෙවි කරන අවස්ථාවේදී එම සීනි තොගය මිලට ගෙන තිබුණේ 1kg ක් රු. 125.41 ක් වැනි මිලකට ය. නමුත් එම අවස්ථාවේ සිදුවූ ගනුදෙනු සම්බන්ධයෙන් ආයතනයේ නිලධාරීන් කිසිදු දැනුවත්වීමක් වී නොතිබිණි.

මෙලෙස රට තුළ දැවැන්ත සීනි තොගයක් පවතින අවස්ථාවක, සීනි හිඟයක් නිර්මාණය කර සීනි මිල ඉතා ඉහළ අගයකින් වැඩිකිරීම ජනසමාජයට සිදුකළ විශාල අපරාධයක් බව කාරක සභාව පෙන්වා දුන්නාය.

<u>නිර්දේශ</u>

**i.** මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

ii. 2020 ඔක්තෝබර් මස 14 දින සිට බලපවත්වන පරිදි සීනි ආනයනය කිරීමේදී අයකරනු ලබන බදු ප්‍රතිශතය අඩු කිරීම හේතුවෙන් සමාගමට සිදුවූ අලාභය සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදු කිරීම.

## 3.7 ඒකාබද්ධ ආයතන සැලසුම් පද්ධතිය (Integrated Enterprise Resource Planning)

2012 වර්ෂයේදී පළමුවෙන්ම ERP පද්ධතියක් ආරම්භ කර ඇති බවත් එය ක්‍රියාත්මක වෙමින් තිබියදී නැවත 2017 වර්ෂයේදී නව ආයතනයක් මගින් නව පද්ධතියක් ආරම්භ කර, ඒ සඳහා රු. මිලියන 83ක් වියදම් කර තිබීම හා 2021 ජනවාරි 26 දක්වා සමාගමේ ක්‍රියාත්මකව පැවති ඒකාබද්ධ ආයතන සම්පත් සැලසුම් පද්ධතිය නව පද්ධතියකට මාරු කර ඇති බවත් එම කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත්කරුට නොදන්වා අවසන් කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු, සමාගමට එරෙහිව රු. 114, 941, 955ක වන්දි මුදලක් ඉල්ලා නඩු පවරා ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. කෙසේ වුවද එම අගය රුපියල් මිලියන 112 ක් ලෙස නිවැරදි විය යුතු බව අනාවරණය විය.

එම නඩු කටයුත්ත මේ වන විට නතරවී ඇති බවද කාරක සභාවට අනාවරණය විය.

2021 වර්ෂයේ දී නව ERP පද්ධතියක් සඳහා රු. මිලියන 201ක් පමණ වියදම් කර ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කිරීමේදී තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයේ අවසාන පද්ධති විගණනය සහ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය (UAT) කර නොමැති අතර පද්ධතිය සමාගමට පවරාගැනීමක් සිදුව නොතිබුණද නඩත්තු ගිවිසුමකට එළඹ 2023 වර්ෂයේ පද්ධතියේ නඩත්තු වියදම ලෙස රු.30, 559, 286 ක මුදලක් ගෙවා තිබුණි. පද්ධතිය හරහා වැටුප් කළමනාකරණය හා අයවැයකරණය නිසි ලෙස සිදු නොවන බවත් වර්තමාන තත්ත්වය පිළිබඳව සැලකීමේදී ඒකාබද්ධ සැලසුම් පද්ධතියේ දෝෂ රැසක් පවතින බවත් කාරක සභාවට අනාවරණය විය.

තොගවල වයස් විශ්ලේෂණයක් සිදු කිරීමට මෙම පද්ධතියෙන් හැකියාවක් නොමැති බවත් විගණකාධිපති විසින් 2021 හා 2025 වාර්තාවල ද මේ සම්බන්ධව සඳහන් කර ඇති බවත් කාරක සභාව පෙන්වා දුන් අතර, සමාගමේ විගණන මතය ව්‍යාවනය කිරීමට මෙම පද්ධතිය සම්බන්ධ ගැටලුව විශාල වශයෙන් බලපා තිබුණි.

සමාගම විසින් අලුත් ERP යෙදවුමක් ගැනීම සඳහා යෝජනා කර ඇති බව හා ඉදිරියේදී “new platform-based integrated ERP system” කරා යොමුවීමට සැලසුම් කර ඇති බව ද, මේ සඳහා ඩිජිටල් ආර්ථික කටයුතු සම්බන්ධ අමාත්‍යවරයා හා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය (ICTA -Information & Communication Technology Agency of Sri Lanka) සමග සාකච්ඡා කර ඇති බව ද කාරක සභාවට අනාවරණය විය.

ඒකාබද්ධ ආයතන සැලසුම් පද්ධතියක් සඳහා වසර ගණනක් පුරාවට රු.මි. 400 ක පමණ මුදලක් වැය කළ ද කිසිදු දත්තයක් නිවැරදිව ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට එම යෙදවුම සකස් කර ගැනීමට අපොහොසත් වීම සම්බන්ධව කාරක සභාව සිය අප්‍රසාදය පළ කළාය.

**නිර්දේශය**

i. ව්‍යවසාය සැලසුම් පද්ධතිය (Enterprise Resource Planning System) සඳහා ඍජු ලෙස මැදිහත්වී අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## 3.8 කාර්යසාධන දීමනා හා වෘත්තීය දීමනා

ආයතනය අලාභ ලබමින් සිටින පසුබිමක භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ප්‍රධාන විධායක නිලධාරීට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 07 දෙනෙක් සඳහා කාර්යසාධන දීමනා ලෙස රු. 75,000 බැගින් 2019 වර්ෂයේදී රු.4,350,000 ක් ද, 2021 වර්ෂයේදී රු.5,290,000 ක් ද ගෙවා තිබුණි. 2023 වර්ෂයේදී ප්‍රධාන විධායක නිලධාරීට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 05 දෙනෙකු සඳහා මසකට රු. 75,000 බැගින් එකතුව රු.3,292,500 ක් ගෙවා තිබුණි.

2024 මැයි 29 දිනැති අංක 142/2024 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව 2024 වර්ෂය දක්වා මාසිකව රු.75,000 බැගින් ලබා දී තිබූ කාර්යසාධන දිමනාව, කාර්යසාධන ඇගයීමකින් තොරව ප්‍රධාන විධායක නිලධාරීට රු.150,000 ක් සහ නියෝජ්‍ය සමාන්‍යාධිකාරීවරුන් සඳහා රු.100,000 ක් වශයෙන් වැඩිකර තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේදී රු. 6,933,750 ක් භාණ්ඩාගාර අනුමැතිය රහිතව කාර්යසාධන දීමනා ලෙස ගෙවා තිබුණි.

එමෙන්ම 2024 මැයි මස 04 වන දින පැවති 142 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සඳහා මාසිකව රු.100,000 ක් හා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සඳහා මාසිකව රු.75,000 ක්ද වශයෙන් වෘත්තීය දීමනාවක්ද 2024 ජුනි මස සිට ලබාදීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේදී වෘත්තීය දීමනා ලෙස රු.3,618,332 ක මුදලක් භාණ්ඩාගාර අනුමැතිය රහිතව ගෙවා තිබුණි.

ආයතනය අලාභ ලබමින් සිටින පසුබිමක භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මෙලෙස කාර්යසාධන දීමනා හා වෘත්තීය දීමනා ගෙවීම සම්බන්ධව කාරක සභාවේ අප්‍රසාදය පළ විය. ආයතනය සංවර්ධනය කිරීම වෙනුවෙන් කරන ගෙවීමක් ආයතනය බංකොලොත් කිරීම වෙනුවෙන් ගෙවීම කෙතරම් දුරට තාර්කිකද යන්න විමසූ කාරක සභාව එම ගෙවීම් සිදු කිරීමේදී ආයතනයේ මූල්‍යමය තත්ත්වය පිළිබඳව පරීක්ෂා කළ යුතුව තිබූ බව අවධාරණය කළාය. මෙහිදී සමාගමේ අභ්‍යන්තර විගණකගේ කාර්යභාරය හා එවක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු කර ඇති ආකාරය සම්බන්ධව කාරක සභාව සිය අප්‍රසාදය පළ කළාය.

<u>නිර්දේශ</u>

i. කාර්යසාධනය විගණනයට ලක්කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
ii. අභ්‍යන්තර විගණනය වගකීම් සහගතව කටයුතු කිරීමට වගබලා ගැනීම.
iii. මෙම ගෙවීම් පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම.

## 3.9 ප්‍රවාහන දීමනා

ප්‍රවාහන දීමනා ලබා ගැනීමට හිමිකමක් නොමැති MM 1-1 ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් 11 දෙනෙකුට 2022 වර්ෂයේදී මාසිකව රු. 12, 500 බැගින් රු.1,487, 500 ක් ප්‍රවාහන දීමනා ලෙස ගෙවා තිබුණි. 2023 වර්ෂයේදී ප්‍රවාහන දීමනා හිමිකම් නොමැති ඉහත ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් 19 දෙනෙකු සඳහා මාසිකව රු. 12, 500 බැගින් හා රු. 25,000 බැගින් රුපියල් 2,807,083 ක් ගෙවා තිබුණි. 2024 වර්ෂයේදී නිලධාරීන් 19 දෙනෙකු සඳහා මාසිකව රු. 25, 000 බැගින් රු.475,000 ක් සහ JM 1-1 ශ්‍රේණියේ තනතුරු දරන නිළධාරීන් 31 ක් සඳහා රු.10,000 බැගින් රු. 310,000 ක් ප්‍රවාහන දීමනා ලෙස ගෙවා තිබුණි.

තවද 2024 මැයි මස 29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබාදුන් තීරණයකට අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට ලබාදුන් රු.50,000 බැගින් වූ ප්‍රවාහන දීමනාව භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව රු.100,000 ක් දක්වා වැඩිකර ගෙවා තිබුණි.

මෙලෙස ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් නොමැති නිලධාරීන්ට ප්‍රවාහන දීමනා ලබාදීම හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට ලබා දී තිබූ රු. 50,000/- ක ප්‍රවාහන දීමනාව නිසි භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2024.05.29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව රු. 100, 000/- ක් දක්වා ඉහළ නැංවීම සම්බන්ධයෙන් කාරක සභාවේ අප්‍රසාදය පළ විය.

<u>නිර්දේශය</u>

i. ඉහත ගෙවීම් සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කිරිම .

## 04. <u>වර්තමාන කාර්යසාධනය සම්බන්ධයෙන් වන නිරීක්ෂණ</u>

### 4. 1 <u>2023 වර්ෂයේදී, ඍජු මිනිස් පරිභෝජනයට නුසුදුසු ආනයනික සීනි අලෙවි කිරීම</u>

2023 වර්ෂයේදි, ඍජු මිනිස් පරිභෝජනයට නුසුදුසු ආනයනික සීනි මෙට්‍රික් ටොන් 2,269.5ක් ආනයනික සමාගම් 2කින් රු.මිලියන 389.8කට අදාළ ගිවිසුම්වල ප්‍රතිපාදනවලට ද අනුකූල නොවන පරිදි මිලදීගෙන, රසකැවිලි නිෂ්පාදන ආයතන 2කට අලෙවි කර තිබූ අතර සමාගම සිය ආයතනික අරමුණුවලට පටහැනි ලෙස ජනතාවට සහනදායි මිලකට සීනි අලෙවි නොකිරීම මෙන්ම ගුණාත්මකභාවයෙන් තොර සීනි අලෙවි කිරීම.

<u>නිර්දේශය</u>

i. 2023 වර්ෂයේදී මිනිස් පරිභෝජනයට නුසුදුසු සීනි අලෙවි කිරිම සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදුකිරීම.

## 05.<u>වෙනත් කරුණු</u>

### 5.1 <u>ජා ඇළ හා බම්බලපිටිය වෙළඳසැල්</u>

ජා ඇළ හා බම්බලපිටිය වෙළඳසැල් වසා දමා තිබුණි.